Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය**

දීප ව්‍යාප්ත සේවාවන් සහ රාජ්‍ය සේවයේ විධායක ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ
පොදු තරග විභාගය - 2021

පහත සඳහන් දීප ව්‍යාප්ත සේවාවන්හි III ශ්‍රේණියේ තනතුරුවල පවත්නා පුරප්පාඩු සඳහා විවෘත පදනමින් බඳවා ගැනීමේ තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- ශ්‍රී ලංකා පරිපාලන සේවය
- ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය
- ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය
- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය
- ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය

ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතේ අයදුම්කරුගේ අත්සන සහතික කර, අදාළ වන්නේ නම් ආයතන ප්‍රධානියාගේ සහතිකය සමග අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස ඉහළ කෙළවරේ "**දීප ව්‍යාප්ත සේවාවන් සහ රාජ්‍ය සේවයේ විධායක ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ පොදු තරග විභාගය - 2021**" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. **අයදුම්පත් 2021 ජූලි 17 සිට 2021 අගෝස්තු මස 16 දින පැය 24:00 දක්වා** යොමු කළ හැකි වේ.

*සටහන* : අයදුම්පතේ මුද්‍රිත පිටපත ලියාපදිංචි තැපැල් මගින් එවීම අනිවාර්ය වේ. මුද්‍රිත පිටපත තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරු විසින්ම විඳදරා ගත යුතුය.

1. මෙම විභාගය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලබන නියමයන්ට යටත්ව, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2021 නොවැම්බර් මස කොළඹ දී පමණක් පවත්වනු ඇත. රට තුළ උද්ගතවිය හැකි විශේෂ තත්වයක් මත පමණක් විභාගය දිවයින පුරා පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. එතකුදු වුවත් කිසියම් විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කර නොමැති අවස්ථාවකදී එම මධ්‍යස්ථානයට මනාපය පළ කර ඇති අයදුම්කරුවන් වෙනත් විභාග මධ්‍යස්ථානයකට යොමු කරනු ලැබේ. මේ පිළිබඳ වැඩිමනක් විස්තර අයදුම්පතේ සඳහන් කර ඇත). රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමයන්ට යටත්ව මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට විභාග කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

2. මෙම නිවේදනයේ "පත්කිරීම් බලධරයා" යනුවෙන් අදහස් කරනුයේ, "ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය හා ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය යන සේවාවන් සඳහා වන කල්හි රාජ්‍ය සේවා කොමිෂන් සභාව ද ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය සඳහා වන කල්හි රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව ද" වේ.

*බඳවා ගැනීමේ ක්‍රමය* :-

2.1 *මනාපය සටහන් කිරීම* :-
එක් එක් සේවාව සඳහා බඳවා ගැනීමට සපුරා තිබිය යුතු සුදුසුකම් අනුව අයදුම්කරුවකුට සේවා කිහිපයකට අයදුම් කිරීමට හැකියාව ඇත. අයදුම් කිරීමේ දී අයදුම්කරුවන් විසින් ඒ ඒ සේවාව සඳහා තම මනාපය සටහන් කළ යුතුය.

**සැලකිය යුතුයි** :- අයදුම් කිරීමේදී අයදුම්කරු විසින් අයදුම්පතේ සටහන් කරනු ලබන මනාපය පසුව සංශෝධනය කිරීමට ඉඩදෙනු නොලැබේ. අයදුම්කරු විසින් මනාපය සටහන් කර නොමැති සේවාවක් සඳහා පත්වීම් ලබාගැනීමට කරනු ලබන ඉල්ලීම් කිසිදු කරුණක් මත සලකා බලනු නොලැබේ.

2.2 *ලිඛිත විභාගය* :-මෙම තරග විභාගය පහත සඳහන් පරිදි කොටස් දෙකකින් සමන්විතය. එහි පළමු කොටස (පොදු කොටස) සියලුම සේවාවන් සඳහා අදාළ වේ. පළමු කොටසේ එක් එක් ප්‍රශ්න පත්‍රයෙන් 40% හෝ ඊට වැඩි සහ ප්‍රශ්න පත්‍ර දෙකෙහිම මුළු ලකුණු ප්‍රමාණයේ එකතුව 100ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය සහ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය යන සේවාවන්ට අදාළ විභාගයේ දෙවන කොටස සඳහා කැඳවනු ලැබේ.

- ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය සඳහා අදාළ වනුයේ විභාගයේ පළමු කොටස පමණි.

2.2.1. පළමු කොටස (පොදු කොටස)

සියලුම සේවාවන්ට අදාළවන බැවින් සෑම අයදුම්කරුවකුම පෙනී සිටිය යුතුය.

| *විෂය අංකය* | *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත්වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | පැය 1 1/2 | 100 | 40 |
| 02 | අවබෝධය | පැය 02 | 100 | 40 |

2.2.2. *දෙවන කොටස (එක් එක් සේවාවට විශේෂ වන කොටස)*

| *සේවය* | *විෂය අංකය* | *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත්වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|---|
| 1. ශ්‍රී ලංකා පරිපාලන සේවය | 11 | සමාජ,ආර්ථික හා දේශපාලන ප්‍රවණතා | පැය 03 | 100 | 40 |
| | 12 | කළමනාකරණ අභියෝග්‍යතාව | පැය 03 | 100 | 40 |
| | 13 | නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා | පැය 03 | 100 | 40 |
| 2. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 21 | මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණය | පැය 03 | 100 | 40 |
| | 22 | උසස් විගණනය හා ආර්ථික විශ්ලේෂණය | පැය 03 | 100 | 40 |
| 3. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය | 31 | සාමාන්‍ය සම්ප්‍රජානනය | පැය 03 | 100 | 40 |
| 4. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | 41 | සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40 |
| | 42 | විශ්ලේෂණාත්මක අධ්‍යයනය | පැය 1 1/2 | 100 | 40 |

2.3 *සම්මුඛ පරීක්ෂණය* :- ලිඛිත විභාගයේ අදාළ ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන් අතරින් සෑම ලිඛිත ප්‍රශ්න පත්‍රයක් සඳහාම නියමිත ලකුණුවලින් යටත් පිරිසෙයින් 40%ක් හෝ ඊට වැඩි ලකුණු ලබාගත් අයදුම්කරුවන් පමණක්, ලබා ඇති ලකුණු කුසලතා අනුපිළිවෙළ අනුව එක් එක් සේවාවන්ට අදාළ වන පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට හා අදාළ වේ නම් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට/වාචික පරීක්ෂණයකට කැඳවනු ලබන අතර,එම සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන දිනය පත්කිරීම් බලධාරියාගේ නියමය පරිදි තීරණය කරනු ඇත.

2.4 එක් එක් සේවාවන්ට අදාළ වන පරිදි ලිඛිත විභාගයේ ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල මත හෝ ලිඛිත විභාගයේ ලකුණුවල හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී/වාචික පරීක්ෂණයේ දී ලබා ඇති ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල මත හෝ එක් එක් සේවාව සඳහා පත් කිරීම් කරනු ලැබේ. මෙහිදී අයදුම්පතේ සටහන් කර ඇති මනාපය පදනම් කරගනු ලැබේ.

3. *පුරප්පාඩු සංඛ්‍යාව* :-

| *සේවය* | *සේවය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *පුරප්පාඩු ගණනය කළ දිනය* |
|---|---|---|---|
| SLAS | 1. ශ්‍රී ලංකා පරිපාලන සේවය | 155 | 2020.12.31 |
| SLACS | 2. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 144 | |
| SLPS | 3. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය | 139 | |
| SLEAS | 4. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය (සාමාන්‍ය සේවක සංඛ්‍යාව) * | 113 | 2020.06.30 |
| SLSS | 5. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය ** | 85 | 2020.12.31 |

* ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියේ තනතුරු "සාමාන්‍ය සේවක සංඛ්‍යාව" හා "විශේෂ සේවක සංඛ්‍යාව" වශයෙන් කොටස් 2කින් යුක්ත වේ. මෙම විභාගයේ දී බඳවා ගනු ලබන්නේ සාමාන්‍ය සේවක සංඛ්‍යාවට අයත් තනතුරු සඳහා පමණි.

** ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ පුරප්පාඩු සංඛ්‍යාව තවදුරටත් බෙදී ඇති ආකාරය මෙම නිවේදනයේ විද්‍යාත්මක සේවයට බඳවා ගැනීමේ අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් යටතේ දක්වා ඇත.

එක් එක් සේවාව සඳහා පත්කරනු ලබන සංඛ්‍යාව සහ පත්වීම් ක්‍රියාත්මක වන දිනය පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ. අදාළ සේවාවන් සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙළ සහ ලබාදී ඇති මනාපය තරයේම පදනම් කරමින් පත්වීම් සිදු කරනු ලැබේ. කිසියම් සේවාවක පුරප්පාඩු සියල්ල පිරවීමට හෝ නොපිරවීමට හෝ පුරප්පාඩුවලින් යම් කොටසක් පිරවීමට හෝ නොපිරවීමට හෝ පත්කිරීම් බලධරයා හට බලය ඇත.

4. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි* : -

4.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු නියමයන් හා කොන්දේසිවලට ද එක් එක් සේවාවන්ට අදාළ පහත සඳහන් සේවා ව්‍යවස්ථාවල විධිවිධානවලටද අදාළවන පරිදි දෙපාර්තමේන්තු නියෝගවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන හා මුදල් රෙගුලාසිවලට ද අංක 1589/30 සහ 2009.02.20 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීතිවලට ද (මින් මතුවට කාර්ය පටිපාටික රීති ලෙස හඳුන්වනු ලබන) හා ඉහත නියමයන්, කොන්දේසි, නියෝග, විධිවිධාන, රෙගුලාසි හා රීතිවලට දැනටමත් කර ඇති හෝ මින්මතු කරනු ලැබිය හැකි සංශෝධනවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයන් අදාළ සේවයේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ.

| *සේවය* | *සේවා ව්‍යවස්ථාව පළකර ඇති රජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ අංකය හා දිනය* | |
|---|---|---|
| | *අංකය* | *දිනය* |
| ශ්‍රී ලංකා පරිපාලන සේවය | 1842/2 | 2013.12.23 |
| ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 1670/33 | 2010.09.10 |
| ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය | 1670/32 | 2010.09.10 |
| ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | 1928/28 | 2015.08.21 |
| ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 1877/27 | 2014.08.28 |

4.2 මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අයදුම්කරු යටත්විය යුතු වේ. තව ද වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

4.3 මෙම පත්වීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ය. අදාළ සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

4.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020ට අනුව තනතුරට බැඳී වසර 03ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා/ රාජ්‍ය භාෂාවන්හි ප්‍රවීණතාව ලබා ගත යුතුය.

4.5 පත්වීම්ලාභියකු දිවයින තුළ නියම කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

4.6 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේදී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරී භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කිරීමට පත්කිරීම් බලධරයාට බලය ඇත.

5. *වැටුප් ව්‍යුහය හා මාසික වැටුප් පරිමාණය*- 2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරුවලට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 47,615 - 10 x 1,335 - 8 x 1630 - 17 x 2,170 - 110,895/- (SL1 -2016) වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමිවේ.

6. *බඳවා ගැනීමේ සුදුසුකම්* :-

(අ) සාමාන්‍ය සුදුසුකම්

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම.

ii. විශිෂ්ට චරිතයකින් යුක්ත වීම.

iii. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත වීම.

iv. බඳවා ගැනීම සඳහා වන සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනය *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.

(ආ) අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා වයස් සීමාව :-

I. එක් එක් සේවාව සඳහා බඳවා ගැනීමට අදාළ වන වයස් සීමා පහත දැක්වේ.

| *සේවය* | *වයස* |
|---|---|
| ශ්‍රී ලංකා පරිපාලන සේවය<br>ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය<br>ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය | අයදුම්පත් කැඳවීමේ නිවේදනය *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන දිනට වයස අවුරුදු විසිදෙක (22)ට නොඅඩු විය යුතු අතර අවුරුදු විසි අටට (28) ට නොවැඩි විය යුතුය. |
| ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | අයදුම්පත් කැඳවීමේ නිවේදනය *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන දිනට වයස අවුරුදු විසිදෙක (22) ට නොඅඩු විය යුතු අතර අවුරුදු තිස්දෙකට (32) නොවැඩි විය යුතුය. |
| ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | අයදුම්පත් කැඳවීමේ නිවේදනය *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන දිනට වයස අවුරුදු විසිදෙක (22)ට නොඅඩු විය යුතු අතර අවුරුදු විසි අටට (28) ට නොවැඩි විය යුතුය. |

II. ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය සහ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය සඳහා අවශ්‍ය අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් පහත දැක්වේ.

*සටහන* : මෙහි උපාධිය/පශ්චාත් උපාධිය යනුවෙන් හැඳින්වෙන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ පිරිනමනු ලබන උපාධියක්/පශ්චාත් උපාධියක් වේ.

| *සේවය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|
| 1. ශ්‍රී ලංකා පරිපාලන සේවය | උපාධියක් ලබා තිබීම. |
| 2. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | (i) වාණිජ්‍ය, කළමනාකරණ, ගණකාධිකරණ, ආර්ථික විද්‍යා යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළ උපාධියක් ලබා තිබීම ;<br>හෝ<br>(ii) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ/ශ්‍රී ලංකා උසස් කාර්මික අධ්‍යාපන ආයතනයේ/ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ උසස් ඩිප්ලෝමාලාභියකු හෝ උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමාලාභියකු වීම;<br>හෝ<br>(iii) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක වරලත් ගණකාධිකාරී ආයතනයක ආවසරික II හෝ අන්තර් මධ්‍ය පරීක්ෂණය හෝ ගිණුම්කරණ හා ව්‍යාපාර සහතිකය II හෝ ව්‍යාපාර අදියර විභාගය හෝ ආයතනික අදියර II විභාගය හෝ ඊට වඩා ඉහළ පරීක්ෂණයකින් හෝ සමත් වීම;<br>හෝ<br>(iv) එක්සත් රාජධානියේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක වරලත් කළමනාකරණ ගණකාධිකාරීත්ව ආයතනයක් මගින් පවත්වන පිරිවැය සහ කළමනාකරණ පරීක්ෂණයේ I හා II වැනි කොටස් හෝ අන්තර් මධ්‍ය පරීක්ෂණය හෝ ඊට වඩා ඉහළ පරීක්ෂණයකින් හෝ සමත් වීම;<br>හෝ<br>(v) එක්සත් රාජධානියේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක සහතිකලත් ගණකාධිකාරීවරුන්ගේ ගණකාධිකරණ ආයතනයේ I වැනි වෘත්තීය මට්ටමේ හෝ වඩා උසස් මට්ටමක පරීක්ෂණයකින් සමත් වීම ;<br>හෝ<br>(vi) එක්සත් රාජධානියේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක සහතිකලත් ගණකාධිකාරීවරුන්ගේ වරලත් සංගමයේ I වැනි සහ II වැනි කොටසට අයත් පරීක්ෂණය හෝ ඊට ඉහළ පරීක්ෂණයකින් සමත් වීම;<br>හෝ<br>(vii) එක්සත් රාජධානියේ ලේකම්වරුන්ගේ හා පරිපාලකයින්ගේ වරලත් ආයතනයේ අවසාන පරීක්ෂණය සමත් වීම.<br>හෝ<br>(viii) ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ කළමනාකරණ මට්ටම හෝ ඊට වඩා ඉහළ මට්ටමක පරීක්ෂණයකින් සමත් වීම. |
| 3. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය | (i) පළමුවැනි පන්තියේ හෝ දෙවන පන්තියේ සාමර්ථ්‍යයක් සහිත උපාධියක් ලබා තිබීම<br>හෝ<br>(ii) උපාධියක් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ පාර්ලිමේන්තු පනතකින් සංස්ථාපනය වූ පුහුණු ආයතනයකින් ප්‍රදානය කෙරෙන යටත් පිරිසෙයින් වසරකට නොඅඩු පාඨමාලා කාල සීමාවක් සහිත පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම |
| 4. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | උපාධියක් ලබා තිබීම. |
| 5. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | එක් එක් තනතුරට අදාළ අධ්‍යාපන සුදුසුකම් පහත අනු අංක 6 (ආ) III යටතේ ඇති වගුවෙහි ඇතුළත් කර ඇත |

***සටහන*** : ඉහත එක් එක් සේවාවලට අදාළ තනතුරු ඊට අදාළ සේවා ව්‍යවස්ථාවල දක්වා ඇත.

III. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය සඳහා අවශ්‍ය අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් හා පුරප්පාඩු සංඛ්‍යාව පහත දැක්වේ.

| *අනු අංකය* | *අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව* | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 1 | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්ෂ (මානව වංශ විද්‍යා) | 01 | I. ඉතිහාසය හෝ පුරාවිද්‍යාව හෝ පිලිබඳ පන්ති සාමර්ථ්‍යයක් සහිත විශේෂ උපාධිය ලබාතිබීම,<br>හෝ<br>II. ඉහත I හි සඳහන් විෂයක විශේෂ උපාධිය හෝ එම විෂයක් ප්‍රධාන විෂය වූ සාමාන්‍ය උපාධිය සමග එම විෂයකම පශ්චාත් උපාධිය |
| | | සහකාර අධ්‍යක්ෂ (මානව විද්‍යා) | 01 | I. මානව විද්‍යා හෝ සමාජ විද්‍යාව පිලිබඳ පන්ති සාමර්ථ්‍යයක් සහිත විශේෂ උපාධිය ලබාතිබීම,<br>හෝ<br>II. ඉහත I හි සඳහන් විෂයක විශේෂ උපාධිය හෝ එම විෂයක් ප්‍රධාන විෂය වූ සාමාන්‍ය උපාධිය සමග එම විෂයකම පශ්චාත් උපාධිය |
| 2 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන) | 02 | I. කෘෂිකර්මය, අපනයන කෘෂිකර්මය, කෘෂිකර්ම තාක්ෂණය හා කළමනාකරණය, කෘෂිකර්ම විද්‍යාව හා කළමනාකරණය, ජෛව පද්ධති තාක්ෂණය, කෘෂිකාර්මික සම්පත් කළමනාකරණය හා තාක්ෂණය, කෘෂි ව්‍යාපාර කළමනාකරණය, හරිත තාක්ෂණය යන විෂයන්ගෙන් එක් විෂයක පන්ති සාමර්ථ්‍යයක් සහිත සිව් අවුරුදු විද්‍යාවේදී කෘෂිකර්ම උපාධිය හෝ<br>II. උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, ජෛවරසායනය, ජෛවතාක්ෂණය, ජීව විද්‍යාව, ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ ජෛව සංඛ්‍යානය යන විෂයන්ගෙන් එක් විෂයක පන්ති සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ<br>III. උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, ජෛවරසායනය, ජෛවතාක්ෂණය, ජීව විද්‍යාව, ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ ජෛව සංඛ්‍යානය යන විෂයන්ගෙන් අවම වශයෙන් එක් විෂයක් ප්‍රධාන විෂය වශයෙන් හදාරා ඇති පන්ති සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය හෝ<br>IV. ජෛවීය විද්‍යා විද්‍යාවේදී උපාධියක් සමඟ ඉහත කුමන හෝ විෂයක පශ්චාත් උපාධිය ලබා තිබීම. |
| | | සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ) | 03 | I. කෘෂිකර්මය, අපනයන කෘෂිකර්මය, කෘෂිකර්ම තාක්ෂණය හා කළමනාකරණය, කෘෂිකර්ම විද්‍යාව හා කළමනාකරණය, ජෛව පද්ධති තාක්ෂණය, කෘෂිකාර්මික සම්පත් කළමනාකරණය හා තාක්ෂණය, කෘෂි ව්‍යාපාර කළමනාකරණය, හරිත තාක්ෂණය යන විෂයන්ගෙන් එක් විෂයක පන්ති සාමර්ථ්‍යයක් සහිත සිව් අවුරුදු විද්‍යාවේදී කෘෂිකර්ම උපාධිය හෝ<br>II. උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, ජෛවරසායනය, ජෛවතාක්ෂණය, ජීව විද්‍යාව, ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ ජෛව සංඛ්‍යානය යන විෂයන්ගෙන් එක් විෂයක පන්ති සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ |

| *අනු අංකය* | *අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව* | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| | | | | III. උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව, ජෛවරසායනය, ජෛවතාක්ෂණය, ජීව විද්‍යාව, ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ ජෛව සංඛ්‍යානය යන විෂයන්ගෙන් අවම වශයෙන් එක් විෂයක් ප්‍රධාන විෂය වශයෙන් හදාරා ඇති පන්ති සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය හෝ<br>IV. ජෛවීය විද්‍යා විද්‍යාවේදී උපාධියක් සමඟ ඉහත කුමන හෝ විෂයක පශ්චාත් උපාධිය ලබා තිබීම. |
| 3 | ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්ෂ | 01 | I. සත්ව විද්‍යාව, සත්ව විද්‍යාව හා ධීවර විද්‍යාව, ජීව විද්‍යාව, පරිසර සංරක්ෂණය හා කළමනාකරණය, ධීවර විද්‍යාව, ජලජීවී විද්‍යාව, සාගර විද්‍යාව, සාරස විද්‍යාව, පාරිසරික විද්‍යාව හා ස්වාභාවික සම්පත් කළමනාකරණය, ආහාර විද්‍යාව හා පෝෂණය, ආහාර විද්‍යාව, ආහාර විද්‍යාව හා තාක්ෂණය, ආහාර හා පෝෂණය හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව යන විෂයන්ගෙන් එක් විෂයක පන්ති සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී විශේෂ උපාධිය ලබා තිබීම. |
| 4 | රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව | සහකාර රජයේ රසපරීක්ෂක | 11 | I. පන්ති සාමර්ථ්‍යයක් සහිත රසායන විද්‍යා විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ<br>II. රසායන විද්‍යා විශේෂ විද්‍යාවේදී උපාධිය හෝ රසායන විද්‍යාව ප්‍රධාන විෂය වශයෙන් වූ විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය සමඟ රසායන විද්‍යා පශ්චාත් උපාධිය ලබා තිබීම. |
| | | සැකකටයුතු ලේඛන පිළිබඳ සහකාර පරීක්ෂක | *01* | I. රසායන විද්‍යාව, පරිගණකමය රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, පරිගණකමය භෞතික විද්‍යාව, ගණිතමය භෞතික විද්‍යාව හෝ ව්‍යවහාරික භෞතික විද්‍යාව යන විෂයන්ගෙන් එක් විෂයක පන්ති සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ<br>II. ඉහත කුමන හෝ විෂයක විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ එම විෂයක් ප්‍රධාන විෂයක් වූ විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය සමඟ එම විෂයක ම පශ්චාත් උපාධිය හෝ<br>III. අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ විද්‍යා විෂය ධාරාව යටතේ විශ්වවිද්‍යාලයට ඇතුළත්ව පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය හෝ තොරතුරු පද්ධති යන විෂයන්ගෙ න් එක් විෂයක පළමු හෝ දෙවැනි පන්තියේ ඉහළ සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ<br>IV. අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ විද්‍යා විෂය ධාරාව යටතේ විශ්වවිද්‍යාලයට ඇතුළත්ව පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය හෝ තොරතුරු පද්ධති යන විෂයන්ගෙන් එක් විෂයක විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ අවම වශයෙන් එම එක් විෂයක් ප්‍රධාන විෂය වූ සාමාන්‍ය උපාධිය සමඟ පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණ පශ්චාත් උපාධිය ලබා තිබීම. |

| අනු අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 5 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්ෂ | 01 | I. ජීව විද්‍යාව, ව්‍යවහාරික ජීව විද්‍යාව, උද්භිද විද්‍යාව, ශාක විද්‍යාව, ශාක ජීව විද්‍යාව, ශාක ජෛව තාක්ෂණය, අණුක ජීව විද්‍යාව, ජෛව තාක්ෂණය, ජලජ සම්පත් කළමනාකරණය හෝ මත්ස්‍ය විද්‍යාව යන විෂයන්ගෙන් එක් විෂයක පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ<br>II. ජීව විද්‍යාව, උද්භිද විද්‍යාව, ශාක විද්‍යාව හෝ ශාක ජීව විද්‍යාව උප විෂය වශයෙන් වූ පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත සත්ව විද්‍යා විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ<br>III. ජීව විද්‍යාව, උද්භිද විද්‍යාව, ශාක විද්‍යාව හෝ ශාක ජීව විද්‍යාව, වන විද්‍යාව හෝ ස්වාභාවික සම්පත් කළමනාකරණය උප විෂය වශයෙන් වූ පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත රසායන විද්‍යා විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ<br>IV. පරිසර විද්‍යාව, පරිසර කළමනාකරණය, වන විද්‍යාව, පරිසර සංරක්ෂණය, ස්වාභාවික සම්පත් කළමනාකරණය, ජෛව විවිධත්වය හා සංරක්ෂණය යන විෂයන්ගෙන් එක් විෂයක පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ<br>V. ජෛවීය විද්‍යා විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ සාමාන්‍ය උපාධිය සමඟ ඉහත IV හි සඳහන් විෂයක පශ්චාත් උපාධිය හෝ<br>VI. කෘෂිකර්මය, කෘෂිකර්ම තාක්ෂණය හා කළමනාකරණය, කෘෂිකර්ම විද්‍යාව හා කළමනාකරණය, ජෛව පද්ධති තාක්ෂණය, කෘෂිකර්මික සම්පත් කළමනාකරණය හා තාක්ෂණය, හරිත තාක්ෂණය හෝ සත්ව සහ මත්ස්‍ය විද්‍යාව යන විෂයන්ගෙන් එක් විෂයක පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත සිව් අවුරුදු විද්‍යාවේදී කෘෂිකර්ම උපාධි ලබා තිබීම. |
| 6 | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | සහකාර වන සංරක්ෂක | 19 | I. සත්ව විද්‍යාව හෝ රසායන විද්‍යාව උප විෂය වූ උද්භිද විද්‍යාව, ශාක විද්‍යාව හෝ ශාක ජීව විද්‍යාව යන විෂයන්ගෙන් එක් විෂයක පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ<br>II. පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී වන විද්‍යා විශේෂ උපාධිය හෝ<br>III. පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී ජෛවීය විද්‍යා උපාධියක් හෝ<br>IV. කෘෂිකර්මය, කෘෂිකර්ම තාක්ෂණය හා කළමනාකරණය, කෘෂිකර්ම විද්‍යාව හා කළමනාකරණය, ජෛව පද්ධති තාක්ෂණය, කෘෂිකර්මික සම්පත් කළමනාකරණය හා තාක්ෂණය හෝ හරිත තාක්ෂණය යන විෂයන්ගෙන් එක් විෂයක පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත සිව් අවුරුදු විද්‍යාවේදී කෘෂිකර්ම උපාධිය හෝ<br>V. ජෛවීය විද්‍යා හෝ කෘෂිකර්ම විද්‍යා විද්‍යාවේදී උපාධිය සමඟ වන විද්‍යා, උද්භිද විද්‍යා, ජීව විද්‍යා, කෘෂිකර්ම, පරිසර විද්‍යා හෝ වැවිලි කළමනාකරණ පශ්චාත් උපාධිය ලබා තිබීම. |

| අනු අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 7 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | සහකාර පාංශු රසඥ | 02 | I. රසායන විද්‍යාව හෝ කෘෂිකාර්මික රසායන විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයයක පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ<br>II. රසායන විද්‍යාව හෝ කෘෂිකාර්මික රසායන විද්‍යාව ප්‍රධාන විෂයයක් වූ පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය ලබා තිබීම |
| | | පර්යේෂණ නිලධාරී (ඉඩම් පරිහරණ) | 01 | I. ගණිතය, රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයයක පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී විශේෂ උපාධිය ලබා තිබීම |
| 8 | ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව | සහකාර අධ්‍යක්ෂ | *01* | I. උද්භිද විද්‍යාව, ශාක විද්‍යාව, ශාක ජීව විද්‍යාව, උද්‍යාන විද්‍යාව සහ භූ දර්ශන විද්‍යාව, පරිසර විද්‍යාව, පරිසර කළමනාකරණය, වන විද්‍යාව, පරිසර සංරක්ෂණය, ස්වාභාවික සම්පත් කළමනාකරණය, ජෛව විවිධත්වය හා සංරක්ෂණය යන විෂයන්ගෙන් එක් විෂයයක පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ<br>II. කෘෂිකර්මය, කෘෂිකර්ම තාක්ෂණය හා කළමනාකරණය, කෘෂිකර්ම විද්‍යාව හා කළමනාකරණය, ජෛව පද්ධති තාක්ෂණය, කෘෂිකර්මික සම්පත් කළමනාකරණය හා තාක්ෂණය හෝ හරිත තාක්ෂණය යන විෂයයන්ගෙන් එක් විෂයයක පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත සිව් අවුරුදු විද්‍යාවේදී කෘෂිකර්ම උපාධිය හෝ<br>III. ජෛවීය විද්‍යා විද්‍යාවේදී හෝ සිව් අවුරුදු විද්‍යාවේදී කෘෂිකර්ම උපාධිය සමග ඉහත කුමන හෝ විෂයයක පර්යේෂණ පාදක පශ්චාත් උපාධිය ලබා තිබීම |
| 9 | උක්,බඩඉරිඟු,කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබු නැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | සහකාර අධ්‍යක්ෂ | 03 | I. කෘෂිකර්මය, කෘෂිකර්ම තාක්ෂණය හා කළමනාකරණය, කෘෂිකර්ම විද්‍යාව හා කළමනාකරණය, ජෛව පද්ධති තාක්ෂණය, කෘෂිකාර්මික සම්පත් කළමනාකරණය හා තාක්ෂණය, කෘෂිව්‍යාපාර කළමනාකරණය, හරිත තාක්ෂණය යන විෂයයන්ගෙන් එක් විෂයයක පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත සිව් අවුරුදු විද්‍යාවේදී කෘෂිකර්ම උපාධිය හෝ<br>II. උද්භිද විද්‍යාව, ශාක විද්‍යාව, ශාක ජීව විද්‍යාව, රසායන විද්‍යාව, ජෛවරසායනය, ජෛව තාක්ෂණය, ජීව විද්‍යාව, ව්‍යවහාරික ජීව විද්‍යාව යන විෂයන්ගෙන් එක් විෂයයක පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ<br>III. උද්භිද විද්‍යාව, ශාක විද්‍යාව, ශාක ජීව විද්‍යාව, රසායන විද්‍යාව, ජෛවරසායනය, ජීව විද්‍යාව හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව ප්‍රධාන විෂයටක් වූ පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත සාමාන්‍ය විද්‍යාවේදී උපාධිය හෝ<br>IV. ජෛවීය විද්‍යා විද්‍යාවේදී උපාධියක් සමඟ ඉහත කුමන හෝ විෂයයක පශ්චාත් උපාධිය ලබා තිබීම |

| අනු අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 10 | සෞඛ්‍ය අමාත්‍යාංශය | භෞතික විද්‍යාඥ | 17 | I. භෞතික විද්‍යාව, පරිගණකමය භෞතික විද්‍යාව, ඉංජිනේරුමය භෞතික විද්‍යාව, ගණිතමය භෞතික විද්‍යාව, ව්‍යවහාරික භෞතික විද්‍යාව, න්‍යෂ්ටික වෛද්‍ය විද්‍යාව හෝ න්‍යෂ්ටික තාක්ෂණය යන විෂයන්ගෙන් එක් විෂයයක පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ<br>II. ඉහත කුමන හෝ විෂයක විශේෂ උපාධිය හෝ එම එක් විෂයයක් ප්‍රධාන විෂයයක් වූ සාමාන්‍ය උපාධිය හා රාජ්‍ය ආයතනයක හෝ රජයේ ලියාපදිංචි වෛද්‍ය ආයතනයක විකිරණ ශිල්පියකු වශයෙන් වසර 05 ක සේවා පළපුරුද්ද ලබා තිබීම |
| | | රසඥ | 02 | I. රසායන විද්‍යාව, ජෛවරසායන විද්‍යාව, ජෛව තාක්ෂණය, රසායන තාක්ෂණය හෝ ආහාර විද්‍යාව යන විෂයන්ගෙන් එක් විෂයයක පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ<br>II. ලංකා රසායන විද්‍යා ආයතනයේ හෝ සමාන වෙනත් ජාතික රසායන සංගමයක සාමාජිකත්වය හා පිළිගත් ආයතනයක ආහාර විශ්ලේෂණය පිළිබඳ අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද හෝ<br>III. ජෛවීය විද්‍යා උපාධියක් හා ආහාර විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් සහිතව පිළිගත් ආයතනයක ආහාර විශ්ලේෂණය පිළිබඳ අවම වශයෙන් වසර 02 ක පළපුරුද්ද ලබා තිබීම |
| | | පර්යේෂණ නිලධාරී (කීට විද්‍යා) | 01 | I. කීට විද්‍යාව විෂයයක් වශයෙන් ඇතුළත් පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී සත්ත්ව විද්‍යා විශේෂ උපාධිය හෝ<br>II. විද්‍යාවේදී සත්ත්ව විද්‍යා විශේෂ උපාධිය හෝ සත්ත්ව විද්‍යාව ප්‍රධාන විෂයයක් වූ සාමාන්‍ය විද්‍යාවේදී උපාධිය සමඟ කීට විද්‍යා පශ්චාත් උපාධිය ලබා තිබීම |
| | | පර්යේෂණ නිලධාරී (ක්ෂුද්‍රජීව විද්‍යාව - බැක්ටීරියාවේදය, වෛරසවේදය) | 09 | I. පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී ක්ෂුද්‍රජීව විද්‍යා විශේෂ උපාධිය හෝ<br>II. ජෛවීය විද්‍යා උපාධියක් සමඟ ක්ෂුද්‍රජීව විද්‍යා පශ්චාත් උපාධිය ලබා තිබීම |
| | | පර්යේෂණ නිලධාරී (පරපොෂවේදය) | 01 | I. පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී සත්ත්ව විද්‍යා විශේෂ උපාධිය හෝ<br>II. ජෛවීය විද්‍යා උපාධියක් සමඟ පරපෝෂවිද්‍යාව පශ්චාත් උපාධිය ලබා තිබීම |
| | | පර්යේෂණ නිලධාරී (ස්වාභාවික නිෂ්පාදන රසායනය) | 02 | I. රසායන විද්‍යාව, ජෛවරසායන විද්‍යාව, පරිගණකමය රසායන විද්‍යාව, ජෛව තාක්ෂණය හෝ ශාක ජෛව තාක්ෂණය යන විෂයන්ගෙන් එක් විෂයයක පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ<br>II. ඉහත කුමන හෝ විෂයයක විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ එම විෂයයක් ප්‍රධාන විෂය වූ විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය සමග ජෛව තාක්ෂණය, ශාක ජීව විද්‍යාව හෝ ස්වභාවික නිෂ්පාදන රසායන විද්‍යාව පිළිබඳ පර්යේෂණ පාදක පශ්චාත් උපාධිය ලබා තිබීම |

| අනු අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| | | පර්යේෂණ නිලධාරී (එන්නත් නිෂ්පාදන) | 01 | I. රසායන විද්‍යාව, ක්ෂුද්‍රජීව විද්‍යාව, ජෛවරසායනය, අණුක ජීව විද්‍යාව, ජෛව තාක්ෂණය, ශාක ජෛව තාක්ෂණය යන විෂයන්ගෙන් එක් විෂයයක පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ<br>II. රසායන විද්‍යාව උප විෂයය වශයෙන් හදාරා ඇති පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී සත්ත්ව විද්‍යා විශේෂ උපාධිය හෝ<br>III. රසායන විද්‍යාව, ක්ෂුද්‍රජීව විද්‍යාව, ජෛවරසායනය, අණුක ජීව විද්‍යාව, ජෛව තාක්ෂණය, ශාක ජෛව තාක්ෂණය යන විෂයන්ගෙන් එක් විෂයයක විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ රසායන විද්‍යාව උප විෂයය වශයෙන් හදාරා ඇති විද්‍යාවේදී සත්ත්ව විද්‍යාව විශේෂ උපාධිය, හෝ ඉහත කුමන හෝ විෂයයක් ප්‍රධාන විෂයක් වූ විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය සමග ක්ෂුද්‍රජීව විද්‍යාව හෝ ජෛව රසායනය පශ්චාත් උපාධිය ලබා තිබීම |
| | | කීට විද්‍යාඥ | 02 | I. කීට විද්‍යාව විෂයයක් වශයෙන් ඇතුළත් වූ පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී සත්ත්ව විද්‍යා විශේෂ උපාධිය හෝ<br>II. විද්‍යාවේදී සත්ත්ව විද්‍යා විශේෂ උපාධිය හෝ සත්ත්ව විද්‍යාව ප්‍රධාන විෂයයක් වශයෙන් වූ විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය සමග කීට විද්‍යා පශ්චාත් උපාධිය ලබා තිබීම |
| | | ජෛව රසඥ | 01 | I. පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී ජෛවරසායනය විශේෂ උපාධිය හෝ<br>II. රසායන විද්‍යාව හෝ ජෛවරසායන විද්‍යාව විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ රසායන විද්‍යාව හෝ ජෛවරසායන විද්‍යාව ප්‍රධාන විෂය වූ විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය සමග ජෛවරසායන විද්‍යාව පශ්චාත් උපාධිය ලබා තිබීම |
| | | විද්‍යාත්මක නිලධාරී | 01 | I. රසායන විද්‍යාව, ජෛවරසායනය, පරිගණකමය රසායන විද්‍යාව හෝ රසායන තාක්ෂණය යන විෂයන්ගෙන් එක් විෂයයක පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ<br>II. රසායන විද්‍යාව හා භෞතික විද්‍යාව යන විෂයන් දෙකම ප්‍රධාන විෂයයන් වූ පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය හෝ<br>III. ලංකා රසායන විද්‍යා ආයතනයේ හෝ සමාන ජාතික රසායන විද්‍යා සංගමයක සාමාජිකත්වය හෝ<br>IV. ඉහත I හි සඳහන් විෂයයක විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ රසායන විද්‍යාව හා භෞතික විද්‍යාව යන විෂයන් දෙකම ප්‍රධාන විෂයයන් වූ විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය සමග පර්යේෂණ පාදක රසායන විද්‍යා පශ්චාත් උපාධිය ලබා තිබීම |

| අනු අංකය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 11 | වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | සහකාර අධ්‍යක්ෂ | 01 | I. රසායන විද්‍යාව, ජෛව රසායන විද්‍යාව, ජෛව තාක්ෂණය, පරිගණකමය රසායන විද්‍යාව, කාර්මික රසායන විද්‍යාව, බහු අවයවික රසායන විද්‍යාව, රසායන තාක්ෂණය, භෞතික විද්‍යාව, පරිගණකමය භෞතික විද්‍යාව, ඉංජිනේරුමය භෞතික විද්‍යාව, ගණිතමය භෞතික විද්‍යාව හෝ ව්‍යවහාරික භෞතික විද්‍යාව යන විෂයන්ගෙන් එක් විෂයක පළමු හෝ දෙවැනි පන්තියේ සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ<br>II. ඉහත විෂයන්ගෙන් අවම වශයෙන් එක් විෂයයක් ප්‍රධාන විෂයයක් වූ පළමු හෝ දෙවන පන්තියේ සාමර්ථ්‍යයක් සහිත විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය හෝ<br>III. ඉහත කුමන හෝ විෂයයක විද්‍යාවේදී විශේෂ උපාධිය හෝ ඉහත විෂයන්ගෙන් අවම වශයෙන් එක් විෂයයක් ප්‍රධාන විෂයයක් වූ විද්‍යාවේදී සාමාන්‍ය උපාධිය හා එම එක් විෂයක පශ්චාත් උපාධිය ලබා තිබීම |

(ඇ) *සුදුසුකම් පිළිබඳ සීමාවන්* :
ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය සහ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය සඳහා කුමන හෝ ආගමක පැවිදිවරයක් දරන කිසිඳු තැනැත්තකුට අයදුම්කිරීමට හෝ පෙනී සිටීමට හෝ අවසර නොමැත.(ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට මෙය අදාළ නොවේ.)

7. *විභාග කොන්දේසි* :-

I. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂා මාධ්‍යයකින් විභාගයට පෙනී සිටිය හැකිය. අපේක්ෂකයන් මෙම විභාගය සඳහා තමා විසින් අයදුම් කරනු ලබන සේවාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුතු අතර ඒ සඳහා එක් භාෂා මාධ්‍යයක් පමණක් තෝරා ගත යුතු ය. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙහි සඳහන් කරනු ලබන විභාග මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

II. මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපතට අමතරව ලියාපදිංචි තැපෑලෙන් මුද්‍රිත පිටපතක්ද යොමු කළ යුතුය. මෘදු පිටපත සහ මුද්‍රිත පිටපත (printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු සත්‍යාපනය කිරීම (verify) සිදු කරනු ලබන අතර වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව /භාර නොගන්නා බව ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instruction) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේදී මෙම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් පසුව කරනු ලබන විමසීම් වලදී ඉදිරිපත් කිරීමට ළඟ තබා ගත යුතුය. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිඳු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

III. මෙම විභාගයේ පළමු කොටසේ විභාග ගාස්තුව රු. 1000/- (දහස) කි. දෙවන කොටස සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට රු.300/- (තුන් සියය) කි. දෙවන කොටස සඳහා විභාග ගාස්තු ගෙවිය යුත්තේ පළමු කොටස සමත් වීමෙන් අනතුරුවය. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේදය යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

(i) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)

(ii) අන්තර්ජාල ගෙවීම් පහසුකම් සක්‍රීය කර ඇති බැංකු හර කාඩ්පතක් මගින් (Bank Debit Card with Internet Payment Facility)

(iii) ලංකා බැංකු ඔන්ලයින් බැන්කින් ක්‍රමය මගින් (Bank of Ceylon Online Banking Bill Payment Method)

(iv) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Bank of Ceylon any Branch)

(v) තැපැල් දෙපාර්තමේන්තුවේ තැපැල් කාර්යාලයක් මගින් (Postal Department Payment at a Post Office)

**සටහන** - ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

IV. ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් දන්වනු ලැබේ. විභාගයේ දෙවන කොටස සඳහා විභාග ගාස්තු ගෙවීමේදී අපේක්ෂකයා අයදුම් කරන ලද සියලු සේවාවන් සඳහා නියමිත ප්‍රශ්න පත්‍ර සියල්ලටම එක් ප්‍රශ්න පත්‍රයකට රුපියල් 300/- (තුන්සියයක්) බැගින් ගෙවිය යුතුය. මෙම මුදල ගෙවිය යුත්තේ විභාගයේ පළමු කොටස සමත් වීමෙන් පසුව දෙවන කොටසට අදාළ ප්‍රවේශ පත්‍රය ලබා ගැනීමේ දී ය. අදාළ වන පරිදි නියමිත මුදලම ගෙවිය යුතු අතර, විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ. එසේම විභාගයේ පළමු කොටස අවසානයේදී අයදුම්කරුවන් දෙවන කොටස සඳහා සුදුසුකම් ලබා ඇති/නැති බව විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. විභාගයේ පළමු කොටස සමත් වන අයදුම්කරුවන්ට ඒ බව දැනුවත් කිරීමට කටයුතු කරන බැවින් ඉල්ලුම් පත්‍රයේ සටහන් කර ඇති ජංගම දුරකථන අංකය සක්‍රීයව තබා ගැනීම අයදුම්කරුවන්ගේ වගකීමකි.

V. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිදු හේතුවක් මත ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරුකිරීම හෝ කරනු නොලැබේ.

VI. අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශපත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. රජයේ සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/රාජ්‍ය සංස්ථාවක සේවය කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසල් ප්‍රධානියකු/ විශ්‍රාමික නිලධාරියකු කොට්ඨාසයේ ග්‍රාමනිලධාරීවරයා, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධහමුදාවේ අධිකාරී ලත් නිලධාරියකු, රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේනමක් හෝ අන්‍ය ආගමික පූජ්‍යස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

**සටහන** : ප්‍රවේශපත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළුවීමට ඉඩදෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශපත්‍රය පමණි. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකමක් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

VII. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට අයදුම්පතේ මුද්‍රිත පිටපත එවා ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. එසේම ප්‍රවේශපත්‍රයේ පිටපතක් බාගත කර ගැනීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය ඔස්සේ පහසුකම් සපයනු ඇත. විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් තම ප්‍රවේශපත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම්, දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම් එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශපත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට අයදුම්කරුගේ **ෆැක්ස්** අංකයක් ද සඳහන් කළ ඉල්ලීම් ලිපියක් **0112784232 ෆැක්ස් අංකය** වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළග තබාගත් අයදුම්පතේ මුද්‍රිත පිටපත ගෙවීම් විස්තර සහ තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීමද ප්‍රයෝජනවත් වනු ඇත.

**සටහන :** ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය සහ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය යන සේවාවන් සඳහා අයදුම්කරනු ලැබූ අයදුම්කරුවන් අතරින් ලිඛිත විභාගයේ පළමු කොටසේ (පොදු කොටස) එක් එක් ප්‍රශ්න පත්‍රයෙන් ලකුණු 40% හෝ ඊට වැඩි සහ ප්‍රශ්නපත්‍ර දෙකෙහි මුළු ලකුණු ප්‍රමාණය 100ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබන අයදුම්කරුවන් සඳහා පමණක් දෙවන කොටස (අදාළ සේවාවට විශේෂ වන කොටස) සඳහා නැවත ප්‍රවේශපත්‍රයක් නිකුත් කරනු ලැබේ.

VIII. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

IX. විභාග අපේක්ෂක අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(i) ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

8. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :-* අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ ඇය ඕනෑකමකින් යටපත් කර ඇති බව පත්වීම් ලබා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඔහුගේ/ ඇයගේ පත්වීම අවලංගු කරනු ලබන අතර, අදාළ පත්වීම යටතේ වැටුප් හා දීමනා ලෙස රජය/ පළාත් සභා විසින් ගෙවා ඇති සියලු මුදල් අයකර ගනු ලැබේ.

9. *විභාග මාධ්‍යය :-*

(*අ*) විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.
(*ආ*) විභාගයට පෙනී සිටින ලද මාධ්‍යය පත්වීම් මාධ්‍යය ලෙස සලකනු ලැබේ.
(*ඇ*) අපේක්ෂකයකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.
(*ඈ*) තම අයදුම්පතෙහි සඳහන් විභාග භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට ඉඩ දෙනු නොලැබේ.

10. විභාග ක්‍රමය, සම්මුඛ පරීක්ෂණ හා පත්කිරීම :

10.1. *ලිඛිත විභාගය :-*

10.1.1. පළමු කොටස (පොදු කොටස)

මෙම කොටස සඳහා සියලුම අයදුම්කරුවන් පෙනී සිටිය යුතුය.

| *ප්‍රශ්න පත්‍රය* | *විෂයය නිර්දේශය* | *ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය* |
|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයා සතු තර්කනය, ආදේශනය, අර්ථකථනය, සම්බන්ධතා දැකීම, පරිවර්තනය, ගැටලු විසඳීමේ හැකියාව, හේතුඵල සම්බන්ධතා අවබෝධ කර ගැනීම, පුරෝකථනය, තොරතුරු සංවිධානය, රටා හඳුනාගැනීම සහ උපදෙස් පිළිපැදීම ආදී හැකියා මැනීම සඳහා සකස් කරනු ලබන බහුවරණ වර්ගයේ ප්‍රශ්නවලින් යුක්ත වේ. | බහුවරණ ප්‍රශ්න සහ/හෝ කෙටි ප්‍රශ්න 50කින් සමන්විත වේ.<br><br>ලකුණු 100<br>කාලය පැය 1 1/2 |

| *ප්‍රශ්න පත්‍රය* | *විෂයය නිර්දේශය* | *ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය* |
|---|---|---|
| 2. අවබෝධය | අපේක්ෂකයා සතු කරුණු අවබෝධ කර ගැනීමේ හැකියාව, සන්නිවේදන කුසලතා, සාරාංශකරණය, විවරණය හා නිර්මාණාත්මක බව ආදී කුසලතා මැනීම සඳහා සකස් කරනු ලබන වාස්තවික ප්‍රශ්නවලින් යුක්ත වේ. | බහුවරණ ප්‍රශ්න සහ/හෝ කෙටි ප්‍රශ්න 50කින් සමන්විත වේ.<br>ලකුණු 100<br>කාලය පැය 02 |

10.1.2. දෙවන කොටස (අදාළ සේවාවට විශේෂ වන කොටස)

ශ්‍රී ලංකා පරිපාලන සේවයට, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට සහ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයට පෙනී සිටින අයදුම්කරුවන් සඳහා අදාළ වේ. මෙම සේවාවන්ට අයදුම්කරනු ලබන සෑම අයදුම්කරුවකුම අයදුම්කරන ලද සේවාවට/ සේවාවලට අදාළ ප්‍රශ්න පත්‍ර සියල්ලටම පෙනී සිට සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම ලකුණු 40% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබා තිබිය යුතුය.

(අ) ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීමට අදාළ විශේෂිත කොටස :

(I) ප්‍රශ්න පත්‍ර ව්‍යුහයඃ-

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය* |
|---|---|---|
| 11. සමාජ, ආර්ථික හා දේශපාලන ප්‍රවණතා | පැය 03 | මුළුලකුණු 100යි, සමත් අවම ලකුණ 40%යි.<br>ව්‍යුහගත රචනා, බහුවරණ ප්‍රශ්න සහ/හෝ කෙටි ප්‍රශ්නවලින් සමන්විත වේ. |
| 12. කළමනාකරණ අභියෝග්‍යතාව | පැය 03 | මුළු ලකුණු 100යි, සමත් අවම ලකුණ 40%යි.<br>ව්‍යුහගත රචනා, බහුවරණ ප්‍රශ්න සහ/හෝ කෙටි ප්‍රශ්නවලින් සමන්විත වේ. |
| 13. නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා | පැය 03 | මුළු ලකුණු 100 යි, සමත් අවම ලකුණ 40%යි.<br>රචනා/ අර්ධ ව්‍යුහගත රචනා ප්‍රශ්නවලින් සමන්විත වේ. |

(II) විෂයය නිර්දේශයඃ-

| |
|---|
| 11. සමාජ, ආර්ථික හා දේශපාලන ප්‍රවණතා |
| දේශීය හා විදේශීය සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික, විද්‍යා හා තාක්ෂණ තත්ත්වයන් පිළිබඳ විෂයය දැනුම හෝ අපේක්ෂකයාට යොමු කරනු ලබන තත්ත්වයන් හා අදාළව නිර්මාණාත්මකව, විශ්ලේෂණාත්මකව හා විචාරාත්මකව සිතීමේ හැකියාව, ප්‍රමුඛතාව තීරණය කිරීමේ කුසලතාව හා ක්‍රමෝපායාත්මක අනාගත ප්‍රක්ෂේපණ හැකියාව සම්බන්ධයෙන් හෝ අපේක්ෂකයා සතු කුසලතාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. |
| 12. කළමනාකරණ අභියෝග්‍යතාව |
| ගැටලු හා ඒවාට හේතු හඳුනා ගැනීම, තීරණ ගැනීම, අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම, සන්නිවේදන කුසලතාව, ස්වයං විනය, ප්‍රතිපත්ති හා උපාය මාර්ග සකස් කිරීම සහ භාවමය බුද්ධිය යනාදී වශයෙන් අපේක්ෂකයාට යොමු කරනු ලබන සිද්ධි හා ප්‍රස්තාවන් අනුසාරයෙන් අපේක්ෂකයා සතු කුසලතාව මැන බැලීම මෙයින් අදහස් කෙරේ. |
| 13. නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා |
| දෙන ලද මාතෘකා / තේමා සමූහයක් අතුරින් අපේක්ෂකයා විසින් තෝරා ගන්නා ලද මාතෘකා / තේමා ඔස්සේ අදහස් හා තොරතුරු විශ්ලේෂණය කිරීම, ගොනු කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන තර්කනය සහ පරිකල්පන ශක්තිය මැන බැලීම මෙන්ම සංකීර්ණ ඡේදයක්, ලියවිල්ලක් හෝ සංදේශයක් වටහා ගැනීමට සහ එහි ඇති ප්‍රධාන අදහස් තමාගේම වචනයෙන් සාරාංශ වශයෙන් පැහැදිළිව හා නිවැරදිව ප්‍රකාශ කිරීමට හෝ අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. |

(ආ) ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට බඳවා ගැනීමට අදාළ විශේෂිත කොටස

(I) ප්‍රශ්න පත්‍ර ව්‍යුහය:-

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය* |
|---|---|---|
| 21. මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණය | පැය 03 | මුළු ලකුණු 100 යි, සමත් අවම ලකුණ 40% යි. ප්‍රශ්න පත්‍රය කොටස් 02කින් සමන්විත වේ) (I කොටස සඳහා වන ලකුණු ප්‍රමාණය 60කි II කොටස සඳහා වන ලකුණු ප්‍රමාණය 40කි) |
| 22. උසස් විගණනය හා ආර්ථික විශ්ලේෂණය | පැය 03 | මුළු ලකුණු 100 යි, සමත් අවම ලකුණ 40% යි. ප්‍රශ්න පත්‍රය කොටස් 02 කින් සමන්විත වේ) (I කොටස සඳහා වන ලකුණු ප්‍රමාණය 60කි II කොටස සඳහා වන ලකුණු ප්‍රමාණය 40කි) |

(II) විෂය නිර්දේශය:-

21. මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණය
(මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 02කින් යුක්ත වන අතර ප්‍රශ්න 08කින් සමන්විත වේ)

**I කොටස - මූල්‍ය ගණකාධිකරණය**

මෙම කොටස ප්‍රශ්න පහකින් (05)සමන්විත වේ. පළමු වන ප්‍රශ්නය අනිවාර්යය වන අතර ඉතිරි ප්‍රශ්න හතරෙන් (04)දෙකක් (02)තෝරාගත යුතු ය. සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ප්‍රමාණයක් හිමිවේ.

**1. අනිවාර්යය ප්‍රශ්නය :**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වල භාවිතය පිළිබඳ අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කෙරේ. මෙම ප්‍රශ්නයට අනු කොටස් පහක් ඇති අතර සෑම කොටසකටම ලකුණු 04ක් ලැබේ.

මෙම ප්‍රශ්නය යටතේ පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ලං.ගි.ප්‍රමිත) ආවරණය කරනු ලැබේ.

- මූල්‍ය ප්‍රකාශන - ශ්‍රී.ලං.ගි.ප්‍ර.1
- දේපළ, පිරියත හා උපකරණ - ශ්‍රී.ලං.ගි.ප්‍ර.16
- අයභාරය-ශ්‍රී.ලං.ගි.ප්‍ර. 18
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය - ශ්‍රී.ලං.ගි.ප්‍ර. 7
- තොග - ශ්‍රී.ලං.ගි.ප්‍ර.2
- ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් හා වැරදි - ශ්‍රී.ලං.ගි.ප්‍ර.8
- වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසු සිද්ධි - ශ්‍රී.ලං.ගි.ප්‍ර.10
- කල්බදු - ශ්‍රී.ලං.ගි.ප්‍ර.17
- ආදායම් බදු - ශ්‍රී.ලං.ගි.ප්‍ර12
- ප්‍රතිපාදන, අසම්භාව්‍ය වත්කම් හා අසම්භාව්‍ය වගකීම් - ශ්‍රී.ලං.ගි.ප්‍ර.37
- මූල්‍ය උපකරණ - ශ්‍රී.ලං.ගි.ප්‍ර.39

**2. ප්‍රශ්නය:** මූල්‍ය ප්‍රකාශ සඳහා සංකල්පමය හා නියාමන ආකෘති රාමුව
පොදු පරමාර්ථ, මූල්‍ය ප්‍රකාශවල අරමුණු, ගම්‍ය වාර්තා වූ උපකල්පන, මූල්‍ය ප්‍රකාශවල ගුණාත්මක ලක්ෂණ, මූල්‍ය ප්‍රකාශවල මූලිකාංග, මූල්‍ය ප්‍රකාශවල මූලිකාංග හඳුනාගැනීම හා මිනුම් කිරීම, ප්‍රාග්ධන හා ප්‍රාග්ධන නඩත්තු කිරීමේ සංකල්ප, සංස්ථා පාලනයට අදාළ විධිවිධාන, සමාගම් පනත සහ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ රෙගුලාසි හා නීති.

**3. ප්‍රශ්නය:** ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ ඇතුළු සීමිත වගකීම් සමාගම්වල මූල්‍ය ප්‍රකාශ
වගකීමෙන් සීමිත සමාගමක් සඳහා ඇති අරමුදල් මූලාශ්‍ර හඳුනාගැනීම කොටස් හා ණයකර නිකුත් කිරීම හා නිදහස් කිරීම සඳහා ලෙජර් ගිණුම් පිළියෙල කිරීම, කළමණාකාරීත්වයේ කාර්යයන් සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා පළ කිරීම.

**4. ප්‍රශ්නයඃ** ලාභ නොලබන සංවිධාන සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම

**5. ප්‍රශ්නයඃ** මූල්‍ය ප්‍රකාශ විශ්ලේෂණය, අර්ථ නිරූපණය හා මූල්‍ය ප්‍රතිඵල සන්නිවේදනය කිරීම හා මූල්‍ය නොවන වාර්තාකරණය

**II කොටස - කළමනාකරණ ගණකාධිකරණය**

මෙම කොටස පහත කරුණු ආශ්‍රයෙන් සකස්කරන ලද ප්‍රශ්න 03 කින් සමන්විත වන අතර ප්‍රශ්න 02 කට පිළිතුරු සැපයිය යුතුය. සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ප්‍රමාණයක් හිමිවේ.

1. පිරිවැය ගිණුම්කරණයේ අංග
   පිරිවැය වර්ගීකරණය හැසිරීම, ඇස්තමේන්තුගත කිරීම, ද්‍රව්‍ය හා තොග පාලනය , ශ්‍රම නිශ්චිත හා අඛණ්ඩ ඇණවුම් පිරිවැය

2. පිරිවැය ගිණුම්කරණ ක්‍රම
   අන්තර්ග්‍රහණ පිරිවැයකරණය හා ආන්තික පිරිවැයකරණය, ක්‍රියාකාරකම් පාදක පිරිවැයකරණය, ක්‍රියාවලි පිරිවැයකරණය, ප්‍රතිදාන ගිණුම්කරණය (Throughput Accountancy), නූතන කළමනාකරණ ගිණුම්කරණය

3. ව්‍යාපාර හා ව්‍යාපෘති ඇගයීම් මූලිකාංග සඳහා මූල්‍ය ගණිතය සංයුක්ත, වට්ටම් කිරීම

4. ප්‍රමිත පිරිවැයකරණය හා විචලතා විශ්ලේෂණය

5. ව්‍යාපාර කටයුතු සඳහා ගණිතය

6. අයවැයකරණය හා පුරෝකථනය
   අයවැයකරණය, අයවැය පිළියෙල කිරීම හා අයවැය පාලනය කිරීම

7. අවිනිශ්චිතතාව යටතේ තීරණ ගැනීම
   කෙටිකාලීන හා දිගුකාලීන තීරණ ගැනීම සඳහා තොරතුරු, පිරිවැය - පරිමා - ලාභ විශ්ලේෂණය, වැඩිදුර සැකසීමේ මිලකරණය (Further processing pricing), විවිධ අවහිරතා මධ්‍යයේ තීරණ ගැනීම (Multi - constraint decision making)

8. කාරක ප්‍රාග්ධන කළමනාකරණය

22. උසස් විගණනය හා ආර්ථික විශ්ලේෂණය
(මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 02 කින් යුතු අතර ප්‍රශ්න 08කින් සමන්විත වේ.)

**I කොටස - උසස් විගණනය**

මෙම කොටස පහත කරුණු ආශ්‍රයෙන් සකස් කරන ලද ප්‍රශ්න 05කින් සමන්විත වන අතර ප්‍රශ්න 03කට පිළිතුරු සැපයිය යුතුය. සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ප්‍රමාණයක් හිමිවේ.

1. විවිධ විගණන විධි හා එම විගණනවල අරමුණු
   මූල්‍ය විගණනය, ක්‍රම විගණනය, අනුකූලතා විගණනය, මූල්‍ය විගණනයේ වටිනාකම, කාර්යසාධන විගණනය, ව්‍යවහාරික විගණනය, අභ්‍යන්තර විගණනය, බාහිර විගණනය, කළමනාකරණ විගණනය යනාදිය

2. විගණන සැලසුම්කරණය හා පාලනය
   විගණන සැලසුම්කරණය, කාල නිශ්චය, අන්තර් හා අවසන් විගණනය, කාර්යයන් සඳහා වගකීම් පැවරීම, අභ්‍යන්තර පාලනයේ භාවිතය ඇතුළු සිදුකරන ලද කටයුතු වාර්තා කිරීම, අභ්‍යන්තර පාලනය ඇගයීම සඳහා ප්‍රශ්නාවලි හා ආකෘති පත්‍ර පිළියෙල කිරීම.

3. වෘත්තීමය හැසිරීම හා ආචාර ධර්ම
අවංක බව, ඒකරාශීවීමේදී දක්වන විෂය මූලිකභාවය, විගණන කටයුතු පිළිබඳ තොරතුරු ඇගයීම හා සන්නිවේදනය කිරීම, තොරතුරුවල රහසිගතභාවය, වෘත්තීයභාවය, වෘත්තීමය බැදියාව සහ දැනුම, කුසලතා හා පළපුරුද්ද යොදා ගැනීමේ දක්ෂතාව

4. නෛතික අයිතිවාසිකම් හා වගකීම්
ගණකාධිකාරිවරුන්ගේ හා විගණකවරුන්ගේ නීතිමය වගකීම් හා අදාළ නීතිමය විධිවිධාන

5. අවදානම් තක්සේරු කිරීමේ හා කළමනාකරණය කිරීමේ ශිල්පක්‍රම
විවිධ ආකාරයේ අවදානම්, අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය, ශිල්ප ක්‍රම හා උපකරණ හඳුනාගැනීම හා අවදානම් කළමනාකරණය කිරීම.

6. විගණන ප්‍රමිතීන්
අන්තර්ජාතික විගණන ප්‍රමිති (ISAs) හා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් (SLAuSs)

7. අභ්‍යන්තර විගණනයේ කාර්යයන්
අභ්‍යන්තර විගණනයේ කාර්යයන් හා අභ්‍යන්තර විගණනයේ අරමුණු හඳුනාගැනීම, විගණන කමිටු

8. සාක්ෂි රැස්කිරීම
සාක්ෂි එකතු කිරීමේ විවිධ ක්‍රම හා සාක්ෂි එකතු කිරීමේ ක්‍රියාවලි හඳුනාගැනීම, සාක්ෂිවල වලංගුභාවය සහතික කිරීම

9. වාර්තාකරණ කාර්යයන්
වාර්තා වර්ග, වාර්තාකරණ ප්‍රමිතීන්, ව්‍යුහයන්, වාර්තා කිරීමේ ක්‍රියාවලි, විගණන මත හා පසු විපරම් ක්‍රියාවලි යනාදිය.

**II කොටස - ආර්ථික විද්‍යා විශ්ලේෂණය**

පහත කරුණු ආශ්‍රයෙන් සකස් කරන ලද ප්‍රශ්න 03කින් මෙම කොටස සමන්විත වන අතර ඉන් ප්‍රශ්න 02කට පිළිතුරු සැපයිය යුතුය. සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ප්‍රමාණයක් හිමිවේ.

1. සාර්ව ආර්ථික විචල්‍යයන් අවබෝධ කර ගැනීම
සාර්ව ආර්ථික විචල්‍යයන් හා ප්‍රධාන දර්ශක, සාර්ව ආර්ථික විචල්‍යයන් තක්සේරු කිරීමේ අරමුණ, සාර්ව ආර්ථික විචල්‍යයන් අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධතා සහ ශ්‍රී ලංකාවේ වර්තමාන සංදර්භය හඳුනාගැනීම.

2. ජාතික ආදායම් නිශ්චය කිරීම හා ජාතික ආදායම් ගිණුම්කරණය
ජාතික ආදායම් මැනීමේ ක්‍රම, ජාතික ආදායමේ අංශික දායකත්වය, ප්‍රාග්ධන පරිභෝජනය, පෞද්ගලික පරිභෝජනය, ජාතික නිෂ්පාදන හා සුභසාධනය සහ වර්තමාන ශ්‍රී ලංකා සංදර්භය

3. අන්තර්ජාතික වෙළදාම හා ආර්ථික සංවර්ධනය
අන්තර්ජාතික වෙළඳ නීතිය, අන්තර්ජාතික වෙළඳාම හා ආර්ථික සංවර්ධනය, ගෙවීම් හා විනිමය අනුපාතයේ හැසිරීම තුලනය කිරීම, වර්තමාන ශ්‍රී ලංකා සන්දර්භය

4. විදේශ මූල්‍ය, විදේශ සෘජු ආයෝජන, සංවර්ධනය වන රටවල ණය, ධරණීය ණය කළමනාකරණය, වර්තමාන ශ්‍රී ලංකා සන්දර්භය

5. ප්‍රාග්ධන හා මූල්‍ය වෙළඳපොල, මූල්‍ය අතරමැදියන් හා මූල්‍ය උපකරණ

6. මුදල් ප්‍රතිපත්තිය

7. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය

(ඇ) ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයට බඳවා ගැනීමට අදාළ විශේෂිත කොටස

(I) ප්‍රශ්න පත්‍ර ව්‍යුහයඃ-

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය* |
|---|---|---|
| 31.සාමාන්‍ය සම්ප්‍රජානනය | පැය 03 | මුළු ලකුණු 100 යි, සමත් අවම ලකුණ 40%යි. ව්‍යුහගත රචනා, බහුවරණ ප්‍රශ්න සහ/හෝ කෙටි ප්‍රශ්නවලින් සමන්විත වේ. |

(II) විෂය නිර්දේශයඃ-

| 31. සාමාන්‍ය සම්ප්‍රජානනය |
|---|
| ශ්‍රී ලංකාවේ භූගෝලීය, දේශපාලනීය, ආර්ථික, සාමාජයීය හා සංස්කෘතික පරිසරය ඇතුළු ශ්‍රී ලංකාවේ මුළු පරිසරය පිළිබඳව සහ අන්තර්ජාතික වශයෙන් වැදගත් වන්නා වූ කාලීන තත්ත්වයන් මෙන්ම විද්‍යාත්මක සහ තාක්ෂණ වර්ධනයන් පිළිබඳව අපේක්ෂකයාගේ සම්ප්‍රජානනය පිරික්සීම සඳහා වූ ප්‍රශ්නවලින් සමන්විත වේ. |

(ඈ) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගැනීමට අදාළ විශේෂිත කොටස

(I) ප්‍රශ්න පත්‍ර ව්‍යුහයඃ-

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය* |
|---|---|---|
| 41. සාමාන්‍ය දැනීම | පැය 01 | මුළු ලකුණු 100යි, සමත් ලකුණු 40%යි බහුවරණ/කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 50කින් සමන්විත වේ. |
| 42. විශ්ලේෂණාත්මක අධ්‍යයනය | පැය 1 1/2 | මුළු ලකුණු 100යි, සමත් ලකුණු 40%යි සිද්ධි අධ්‍යයනය ඇතුළත්ව වගු හා ප්‍රස්තාර ආදිය ආශ්‍රයෙන් සකස් කරනු ලබන වාස්තවික ප්‍රශ්නවලින් සමන්විත වේ. |

(II) විෂය නිර්දේශයඃ-

| 41. සාමාන්‍ය දැනීම |
|---|
| අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ එනම් දේශීය අධ්‍යාපන ප්‍රතිපත්ති, නීති, නවීකරණ හා ප්‍රතිසංස්කරණ, දේශීය අධ්‍යාපනයේ ඉතිහාසය හා කාලීන තොරතුරු, අධ්‍යාපනයේ දේශීය හා ජාත්‍යන්තර ප්‍රවණතා ආදී ක්ෂේත්‍රයන් කෙරෙහි වැඩි නැඹුරුවක් සහිතව සහ දේශීය හා විදේශීය අධ්‍යාපනයේ කාලීන තොරතුරු එනම් විද්‍යාත්මක හා තාක්ෂණික, සමාජ- ආර්ථික, දේශපාලනික, භූගෝලීය, නෛතික, පාරිසරික, සංස්කෘතික හා ක්‍රීඩා පිළිබඳ අපේක්ෂකයා සතු දැනුම පරීක්ෂා කිරීම අපේක්ෂා කෙරේ. |
| 42. විශ්ලේෂණාත්මක අධ්‍යයනය |
| අපේක්ෂකයා සතු විශ්ලේෂණ, සංස්ලේෂණ සහ නිර්මාණාත්මක හැකියා මැනීම සඳහා සකස් කරනු ලබන සිද්ධි අධ්‍යයනය ඇතුළත්ව වගු හා ප්‍රස්තාර ආදිය ආශ්‍රයෙන් සකස් කරනු ලබන වාස්තවික ප්‍රශ්නවලින් සමන්විත වේ. |

**සටහන** : ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට අදාළ බඳවා ගැනීම් සඳහා සේවයට අදාළ විශේෂිත ප්‍රශ්න පත්‍ර නොමැති අතර අයදුම්කරුවන් පළමු කොටසේ (පොදු කොටස) ප්‍රශ්න පත්‍ර සඳහා පමණක් පෙනී සිටිය යුතු වේ.

10.2. *සම්මුඛ පරීක්ෂණය* :-

(අ) *ශ්‍රී ලංකා පරිපාලන සේවය :*

පොදු කොටසේ සහ සේවා විශේෂිත කොටසේ සියලුම ලිඛිත ප්‍රශ්න පත්‍ර සඳහා නියමිත ලකුණුවලින් යටත් පිරිසෙයින් 40%ක් හෝ ඊට වැඩි ලකුණු ලැබූ අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය වශයෙන් කොටස් දෙක (02)කින් යුක්ත වේ.

1. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය:-

(i) කුසලතා අනුපිළිවෙළේ රැඳී සිටින අයදුම්කරුවන් අතරින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව හා පුරප්පාඩු ප්‍රමාණයෙන් 25% ක ප්‍රමාණයක් යන දෙකේ එකතුව වශයෙන් ගැනෙන සංඛ්‍යාවක් පමණි. සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව ඉහත දැක්වෙන සංඛ්‍යාවට වඩා අඩු වුවහොත් එවැනි අවස්ථාවන්හි දී සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ එසේ සුදුසුකම් ලැබූ අපේක්ෂකයින් සංඛ්‍යාව පමණි.

(ii) බඳවා ගැනීමේ සුදුසුකම් සපුරා තිබේ ද යන්න හා එහි සඳහන් සුදුසුකම් පිළිබඳ සීමාවන්ට අනුකූල ද යන්න පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. මෙම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමක් සිදු කරනු නොලැබේ.

(iii) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ.

2. *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය* :-

(i) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අයදුම්කරුවන්ගේ කළමනාකරණ කුසලතාව, නායකත්ව ගුණාංග සහ සන්නිවේදන කුසලතාව සහ පෞරුෂත්වය මැන බැලීම සඳහා පහත සඳහන් පරිපාටිය අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහිදී ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසිපහ (25)කි.

| *ක්ෂේත්‍රය* | *උපරිම ලකුණු* |
|---|---|
| 01. කළමනාකරණ කුසලතාව | 10 |
| 02. නායකත්ව ගුණාංග | 05 |
| 03. සන්නිවේදන කුසලතා | 05 |
| 04. පෞරුෂය | 05 |
| එකතුව | 25 |

(ii) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී බඳවා ගැනීමේ සියලු සුදුසුකම් සම්පූර්ණ කරන ලද බව සනාථ වූ අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීම සඳහා සුදුසුකම් ලබයි. ඉහත සඳහන් පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ අයදුම්කරුවන් අතරින් කිසියම් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීම සඳහා සුදුසුකම් නොලැබුව ද එසේ සුදුසුකම් නොලැබූවන් වෙනුවට වෙනත් අයදුම්කරුවන් නැවත සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ.

(iii) පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව බඳවා ගැනීමේ දී ලිඛිත විභාගයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණයේ එකතුව අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුගේ සිට කුසලතා අනුපිළිවෙළින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවාගනු ලැබේ.

(ආ) *ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය :*

පොදු කොටසේ සහ සේවා විශේෂිත කොටසේ සියලුම ලිඛිත ප්‍රශ්න පත්‍ර සඳහා නියමිත ලකුණුවලින් යටත් පිරිසෙයින් 40%ක් හෝ ඊට වැඩි ලකුණු ලැබූ අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ මත

සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සහ වාචික පරීක්ෂණය වශයෙන් කොටස් දෙක (02)කින් යුක්ත වේ.

1. *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය* :-

(i) කුසලතා අනුපිළිවෙළේ රැඳී සිටින අයදුම්කරුවන් අතරින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව හා පුරප්පාඩු ප්‍රමාණයෙන් 25%ක ප්‍රමාණයක් යන දෙකේ එකතුව වශයෙන් ගැනෙන සංඛ්‍යාවක් පමණි. සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව ඉහත දැක්වෙන සංඛ්‍යාවට වඩා අඩු වුවහොත් එවැනි අවස්ථාවන්හි දී සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ එසේ සුදුසුකම් ලැබූ අපේක්ෂකයින් සංඛ්‍යාව පමණි.

(ii) බඳවා ගැනීමේ සුදුසුකම් සපුරා තිබේ ද යන්න හා එහි සඳහන් සුදුසුකම් පිළිබඳ සීමාවන්ට අනුකූල ද යන්න පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.මෙම සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීමක් සිදු කරනු නොලැබේ.

(iii) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් පත් කරනු ලැබේ

2. *වාචික පරීක්ෂණය* :-

(i) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් වාචික පරීක්ෂණයට කැඳවනු ලබන අයදුම්කරුවන්ගේ තර්කනය හා ගැටලු විසඳීම, සන්නිවේදන කුසලතාව සහ පෞරුෂත්වය මැන බැලීම සඳහා වාචික පරීක්ෂණය පවත්වනු ලැබේ.

(ii) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී බඳවාගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවට සනාථ කරන ලද අයදුම්කරුවන් පමණක් වාචික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

(iii) වාචික පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමේදී සලකා බලනු ලබන නිර්ණායක

| *ක්ෂේත්‍රය* | *උපරිම ලකුණු* |
|---|---|
| 1. තර්කනය හා ගැටලු විසඳීම | 10 |
| 2. සන්නිවේදන කුසලතාව | 10 |
| 3. පෞරුෂත්වය | 05 |
| එකතුව | 25 |

(iv) පළමු වටයේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය හා වාචික පරීක්ෂණය පවත්වා එමඟින් පත්වීම් ලබා දී අවසන් කළ පසුව තවදුරටත් පුරප්පාඩු පවතී නම් දෙවන වටයකට සම්මුඛ පරීක්ෂණ පවත්වා ඉතිරි පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලබයි.

(ඇ) *ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය සහ ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය* :

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පමණක් පැවැත්වෙන අතර පොදු කොටසේ සහ සේවා විශේෂිත කොටසේ සෑම ලිඛිත ප්‍රශ්න පත්‍රයක් සඳහාම නියමිත ලකුණුවලින් යටත් පිරිසෙයින් 40%ක් හෝ ඊට වැඩි ලකුණු ලැබූ අයදුම්කරුවන්, පිරවීමට නියමිත පුරප්පාඩු ගණන අනුව කුසලතා අනුපිළිවෙළ මත පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර සම්මුඛ පරීක්ෂණයේ දී සුදුසුකම් සනාථ කළ අයදුම්කරුවන්, ලිඛිත විභාගයේ දී ලබා ඇති ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පත් කිරීම සඳහා තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබේ.

(ඈ) *ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය :*

සාමාන්‍ය සම්මුඛ පරීක්‍ෂණයක් පමණක් පැවැත්වෙන අතර විභාගයේ පළමු කොටසේ (පොදු කොටස) සමත් අදාළ සුදුසුකම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයින් ලකුණුවල කුසලතාවේ අනුපිළිවෙළ අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සුදුසුකම් සනාථ කරනු ලබන අපේක්ෂකයින් ලිඛිත විභාගයේදී ලබා ඇති ලකුණුවල කුසලතා අනුපිළිවෙළ හා තනතුරුවලට ලබා දී ඇති මනාප අනුපිළිවල පදනම්ව බඳවාගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ.

10.3. එක් එක් තනතුරට බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන සංඛ්‍යාව ඉහත නිර්ණායකයන්ට යටත්ව පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ.

*සැලකිය යුතුයි* :- හුදෙක් සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගී වීම පත්වීමක් පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

10.4. විභාගයට පෙනී සිටි සියලු අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දැනුම්දීම විභාග කොමසාරිස් ජනරාල් විසින් තැපෑලෙන් හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය මගින් හෝ සිදුකරනු ලැබේ.

10.5. සේවාවන් කිහිපයකට ඉල්ලුම්කර ඇති අපේක්ෂකයකු තම අයදුම්පතේ සඳහන් කර ඇති මනාපය අනුව සුදුසුකම් ලබන තනතුර සඳහා තෝරා ගනු ලැබේ.

11. මෙහි විධිවිධාන සලසා නොමැති කරුණක් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ අයිතිය පත්කිරීම් බලධරයා සතුවේ.

12. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ එකඟතාව සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එම්.ඒ.බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2021 ජූලි මස 15 වැනි දින.